**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# තිරසාර මූල්‍ය ව්‍යාපෘති නිලධාරී තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

**රැකියාවේ වගකීම්:**

- අවශ්‍යතාව පරිදි තිරසාර මූල්‍ය පිළිබඳ කටයුතු සඳහා සමීක්ෂණ සිදු කිරීම, අධ්‍යයන සිදු කිරීම, වාර්තා සහ සාකච්ඡා සඳහා අවශ්‍ය කරුණු පිළියෙල කිරීම සහ ඒ සම්බන්ධව වෙනත් ඕනෑම ව්‍යාපෘතියක් සිදු කිරීම.
- අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමඟ සිදු කෙරෙන කටයුතු සඳහා සහාය වීම.
- තිරසාර මූල්‍ය පිළිබඳ පාලන කමිටුව (Steering Committee), පාර්ශ්වකරුවන්ගේ කමිටුව සහ තාක්ෂණික කමිටුවට අදාළ ලේකම් කටයුතු සිදු කිරීම.
- අදාළ අංශයේ සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳව ලිපිගොනු පවත්වාගෙන යාම සහ එම වාර්තා යාවත්කාලීන කිරීම.
- අදාළ අංශයේ/දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ අභ්‍යන්තරව හා බාහිරව පවත්වන රැස්වීම්වලට සහභාගී වීම සහ තිරසාර මූල්‍ය සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා සහාය වීම.
- ක්ෂේත්‍රයේ ප්‍රවණතා අධීක්ෂණය කිරීම සඳහා සහාය වීම.
- තිරසාර මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වරින් වර සිදු කරන සමාලෝචන සඳහා සහාය වීම.

**අවශ්‍ය අවම අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද:**

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලැබූ **තිරසාර මූල්‍ය සහ/හෝ පාරිසරික අධ්‍යයනයන්ට අදාළ නිශ්චිත මොඩියුල/පාඨමාලා ඒකක සහිත** ආර්ථික විද්‍යාව, මූල්‍යය, විද්‍යාව හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි වෙනත් ඕනෑම විෂයධාරාවක් පිළිබඳ උපාධියක්.

**සහ**

තිරසාර මූල්‍ය / පාරිසරික අධ්‍යයනයන්ට අදාළ ක්ෂේත්‍රය තුළ ඉහත දක්වා ඇති වගකීම් හා සමාන භූමිකාවක **වසර දෙකක (02) පළපුරුද්ද**.

අපේක්ෂකයින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයෙන් සහ ප්‍රශස්ත වාචික හා ලිඛිත සන්නිවේදන කුසලතාවලින් හෙබි විය යුතු අතර රහස්‍ය හා සංවේදී තොරතුරු මැනවින් හැසිරවීමේ හැකියාව තිබිය යුතුය. MS Office පැකේජ (Word, Excel, PowerPoint) භාවිත කිරීමේ හැකියාව මෙම තනතුර සඳහා පූර්ව අවශ්‍යතාවයක් වේ. තෝරාගත් අයදුම්කරුවන් "අනාවරණය නොකිරීමේ ගිවිසුමකට" එළැඹීම අවශ්‍ය වනු ඇත.

(**අයදුම්පත සමඟ අධ්‍යාපනික සුදුසුකම් (උපාධි පාඨමාලාවට අදාළ ප්‍රතිඵල ලේඛනය (Degree transcript)) සහ සේවා පළපුරුද්ද (රැකියා වගකීම් සහ සේවා කාලය තහවුරු කරන සේවා ලිපි)** සනාථ කිරීමට **අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය**. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය).

**වයස:**
**2024.06.05** දිනට වයස අවුරුදු 40ට වඩා අඩු

**රැකියාව, වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:**

කොන්ත්‍රාත් පදනම මත වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා බඳවා ගැනේ. ආරම්භයේ දී වසරක (01) කාලයක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර, කාර්යසාධනය මත පදනම් ව සෑම වසරක් අවසානයේදීම සේවා ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය සහිතව රු. 400,000ක (බදු ගෙවිය යුතු) මාසික වේතනය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය:**

සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනෙනු ඇත.

**අයදුම්පත්:**

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, අවශ්‍ය සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.06.05** දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** යොමු කළ යුතු ය.

අයදුම්පත් එවීමේදී **"තිරසර මූල්‍ය ව්‍යාපෘති නිලධාරී තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා අයදුම් කිරීම"** යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සහ පළපුරුද්ද සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අයදුම්පත් බාර ගන්නා දිනට පසු ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘතිපත්‍රයට බැහැර අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සහතිකපත් පරීක්ෂාවේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සේ සලකනු නොලැබේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. සම්මුඛ පරීක්ෂණ/ය සඳහා කැඳවීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සුදුසුකම් වලින් ආවරණය වන විෂයය ක්ෂේත්‍රයන්හි අදාළ බව සහ බැංකුවේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි ඔවුන්ගේ සේවා පළපුරුද්දෙහි අදාළ බව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.

බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සලකා බලනු ලැබේ.

අධ්‍යක්ෂ – මානව සම්පත්
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන: **011-2477330** ෆැක්ස්: **011-2477715**